# කටුවන ප්‍රාදේශීය සභාව සඳහා ජල උපකරණ මිළදී ගැනීම.

01. කටුවන ප්‍රාදේශීය සභාව සඳහා ජල උපාංග මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.

02. අදළ පිරිවිතරයන් පහත සඳහන් කර ඇත.

| අනු අංකය | උපකරණය | අවශ්‍ය ප්‍රමාණය | ඒකකයක මිල |
|---|---|---|---|
| 01 | **90mm dia.PNт 7 pvc Pipe** | **335** | |
| **02** | **PVC Bend 90mm x 22.5$^0$** | **20** | |
| **03** | **80mm dia double Orifian air value with 80mm dia flange** | **01** | |
| **04** | **100(4") Medium class GI pipes(19')** | **07** | |

**03.** ජල උපකරණ සඳහා වගකීම් කාලය , නිෂ්පාදිත රට, ආදී තොරතුරු අමුණා ඉදිරිපත් කළ යුතුය.

**04.** තොරාගත් ලංසුකරු විසින් ඇනවුමේ දින සිට සති 01 ක් ඇතුලත අදාළ ජල උපාංග කටුවන ප්‍රාදේශීය සභාව වෙත සපයා භාරදිය යුතුය.

**05.** වගකීම් කාලය තුළ සපයන සේවාවන් කවරේද යන්න පිලිබඳ මිල ගණන් සමඟ එවිය යුතුය.

**06.** උක්ත මිල ගණන් කැඳවිම සඳහා අවශ්‍ය කොන්දේසි පහත පරිදි වේ.

**i.** ඔබ ආයතනය මගින් ඉදිරිපත් කරන මිල ගණන් 2024.07.30 පෙ.ව 10.00ට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ කටුවන ප්‍රාදේශීය සභාවේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක.ඔබගේ මිල ගණන් එවන ලද කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"ජල උපාංග සඳහා මිළ ගණන්** "යන්න සඳහන් කර **ලේකම්, කටුවන ප්‍රාදේශිය සභාව,මිද්දෙනිය**. යන ලිපිනයට එවිය යුතුය, මිළ ගණන් විවෘත කිරීම 2024.07.30 වන දින පෙ.ව 10.30ට සිදු කරන අතර එම අවස්ථාවේදි ඔබ හෝ ඔබ ආයතනයයේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.

**ii.** ඉදිරිපත් කර ඇති මිල ගණන් තාක්ෂණික ඇගයුම් කමිටුව වෙත යොමු කරන අතර මිල ගණන් පිලිගැනීම හෝ නොපිලිගැනීමේ බලය කටුවන ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

**iii.** සඳහන් කර ඇති පිරිවිතරට අනුව අදාළ උපාංගවල ගාස්තු ඇතුලත් එක් එක් ආයිතමය සඳහා වු මුදල ඉතා පැහැදිලිව සඳහන් කළ යුතු අතර , ඒවායේ වෙනස් කිරීමක් හා කපා හැරීමක් සිදු කරන්නේ නම් සැපයුම්කරු විසින් කෙටි අත්සන් යෙදිය යුතුයි.

**iv.** සැපයුම්කරු වෙත භාරදිය යුතු සියලුම දැනුම්දීම මිල ගණන් ඉදිරිපත් කිරීමේදි සපයා ඇති ලිපිනයට තැපැල්කර යවනු ලැබුවහොත් ඒවා නිසි පරිදි ලැබුනා සේ සළකන අතර සැපයුම්කරු සිය ලිපිනය වෙනස්කල හොත් ඒ බව කටුවන සභාවට දැනුම්දිය යුතුය.

සි.එන් ජයසේකර,
ලේකම්,
කටුවන ප්‍රාදේශීය සභාව,
මිද්දෙනිය.